# මගේ උපන්දිනය




ඊ.ඒ.පී තනුලි නිමංසා අතාවුද

# මගේ උපන්දිනය

## ඊ.ඒ.ජී තනුලි නිමංසා අතාවුද


| | | |
|---|---|---|
| කතෘ ගේ නම | - | ඊ.ඒ.ජී තනුලි නිමංසා අතාවුද<br>3 ශ්‍රේණිය A මහාමායා බාලිකා විදුහල |
| කෘතියේ නම | - | මගේ උපන්දිනය |
| කතෘගේ වෙනත් කෘති | - | මලී, වැස්ස දවසක් |
| ISBN | - | 978- 624-208-629-3 |
| දිනය | - | 2024-02- 08 |

# පිදුම.

අකුරින් අකුර ගලපන්න මාහට

කියා දුන් ආදරණීය මාගේ ගුරු

මෑණිවරුන්ටත්

මා ගොතපු  කතාවේ ලියන වචන පේළි

නිවැරදි කර දී සෙවනැල්ලක් මෙන් ළඟ

හිඳිමින් මා දිරිගැන් වූ ආදරණීය

මාගේ අම්මාටත් අප්පච්චිටත් ආදරයෙන්

පිළිගන්වමි.

# පෙරවදන.

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

හෙට නොවැම්බර් 23 වෙනි දා මාගේ උපන් දිනය. මට එතකොට අවුරුදු 8ක් වෙනවා. වෙන අවුරුදු වලට අම්මා ගොඩක් කලින් මගේ  උපන් දිනය සමරන්න සූදානම් වෙනවා .අලුත් ගවුම් මහනවා. සරසන්න බැලුම් බෝල ගෙනවා. උපන් දින කේක් එක හදන්න බඩු ගෙනවා. ඒත් හෙට තියෙන මගේ උපන් දිනය ගෙදර හැමෝටම අමතක වෙලා ද කියලා මට හිතුණා.  කිසිම සූදානමක්වත් කතාවක්වත් ගෙදර  නොතිබුණු නිසා.

අද 23 වෙනි දා මම උදෙන්ම නැගිට්ටා. අම්මා ළඟට ගියා. අම්මා වෙනදා වගේ මාව වඩාගෙන ''ගුඩ් මෝනිං'' කිවුවා. අප්පච්චි ළඟට ගියා. අප්පච්චිත් ''ගුඩ් මෝනිං'' කියලා මාව වඩාගත්තා. අම්මාටයි අප්පච්චිටයි මගේ උපන් දිනය අද කියලා අමතක වෙලා මට දුක හිතුණා. අත්තම්මාට මතක ඇති කියලා මම අත්තම්මා ළඟට ගියා.  අත්තම්මා  වෙනදා වගේම ''ගුඩ් මෝනිං'' කිවුවා. වෙනදාට උදේ අපේ පුංචි අම්මා, අයියා, අක්කා  මාමා , නැන්දා මට සුභ පතනවා . ඒ අය කවුරුත්ම අද තවම මට කතා කළේ නැහැ.




මට ඇඬෙන්න ආව  නිසා මම ඇඳට ඇවිත් මගේ රෝසිව තුරුල් කර ගත්තා . ''රෝසි'' කියන්නේ  මගේ බෝනික්කා.



දන්නේම නැතිව මට ආයෙත් නින්ද ගිහින් තිබුණා. අම්මා මට උදේ කෑම කන්න කතා කරන හඬ ඇහිලා මට ඇහැරුණා . අද අපේ අම්මා අත්තම්මා සමඟ එකතු වෙලා දානය සුදානම් කරනවා. අද අපි දානේ අරන් පන්සල් ගියා. බුද්ධ පූජාව තියලා ස්වාමීන් වහන්සේලාට දානය පූජා කළා . ස්වාමීන් වහන්සේලා සෙත් පිරිත් දේශනා කළා මට හිතුණේම මේ දේවල් කරන්නේ මගේ උපන් දිනය වෙනුවෙන් කියලා.

අයියාට අද පන්ති දවසක් නිසා අම්මා අයියා පන්තියට එක්කන් ගියා. අත්තාම්මා පුංචි අම්මලාගේ ගෙදර යන්න ලෑස්ති වුණ නිසා මමත් අත්තම්මාත් සමඟ පුංචි අම්මලාගේ ගෙදර ගියා. අක්කයි අයියයි සමඟ සෙල්ලම් කළා.






අප්පච්චි පුංචිලාගේ ගෙදරින් මාව අරන් සහස් උයනට සෙල්ලම් කරන්න එක්ක ගියා.මම කැමති ම සහස් උයනේ අච්චාරු,බෝම්බයි මොටයි, අයිස් ක්‍රීම් අප්පච්චි මට අරන් දුන්නා.

ටික ටික රෑ වෙන්න ආවා නිසා අපි දෙන්නා ගෙදර ආවා. ගෙදර එන කොට ගෙදර වහලා තිබුණා. හරිම කළුවරයි ලයිට් දාලාත් නැහැ. මට බය හිතුණා.

මම අප්පච්චිගෙන් ඇහුවා ''අයියායි අම්මායි පන්ති ගිහින් ඇවිත් නැද්ද'' ? ''අත්තම්මා ඇවිත් නැද්ද''? අද ඉන්නනේ පුංචි අම්මලාගේ ගෙදර ද කියලා. අප්පච්චි දොර ඇරියා මම කළුවරට බය නිසා  ඇස් දෙක පියාගෙන අප්පාච්චිගේ අතේ එල්ලිලා ගෙට ඇතුළු වුණා.



ලයිට් එක දැම්මා මට හිතා ගන්න බැරි වුණා. රෝස පාට බැලුම් වලින් සරසලා 'Happy Birthday' කියලා බිත්තියේ අලවලා තිබුණා.



මේසේ උඩ  මම ආසම කරපු විදිහට ලස්සන රෝස පාට පුංචි සුරංගනාවියක් වගේ බෝනික්කෙකුගේ කේක් එකක් අම්මා හදලා තිබුණා. තව එක එක කෑම වලින් මේසය පුරවලා තිබුණා.


අත්තම්මාත් පුංචි අම්මාලා ගෙදර අයත් සමඟ අපේ ගෙදර ඇවිත් හිටියා. හැමෝම එකතු වෙලා මගේ උපන් දිනයට සුබ පැතුවා.

අත්තම්මා මට ලස්සන සපත්තු දෙකක් ගෙනත් තිබුණා. නැන්දාට මාමාට සහ මල්ලීට එන්න බැරි නිසා නැන්දා මට තෑගී ගොඩක් එවලා තිබුණා.

මම ආසම පාට රෝස පාට අම්මා මට ලස්සන රෝස පාට ගවුමක් ගෙනත් තිබුණා. මම එක ඇඳ ගත්තා.



මමත් හරියට ''පුංචි සුරංගනාවියක්'' වගේ කියලා කණ්නනාඩියෙන් මගේ හැඩ බලන කොට මට හිතුණා.




ඊට පස්සේ මම කේක් එක කැපුවා. හැමෝම මට තෑගී දුන්නා. මට හරිම සතුටක් දැනුණා. කාටවත්ම මගේ උපන් දිනය අමතක වෙලා නැහැ කියලා.



අම්මා ඉක්මනින් රසවත් ආහාර වේලක් සුදානම් කරා. හැමෝම එකතු වෙලා සතුටින් ආහාර ගත්තා. විනෝද වුණා. මට ලැබුණු තෑගී බලනකන් ඉවසිල්ලක් නැහැ ඉක්මනට එවා බැලුවා. ලස්සන ටෙඩීලා,චොකලට්,මගේ තෑගි වල තිබ්බා. ගොඩක් රෑ වෙලා තිබුණු නිසා. උපන් දිනය දවස ගත කළ ආකාරය සිතමින් මම නින්දට ගියා.

# පසුවදන.



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්